# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/33 - 2022 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනය

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 05/2022)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2022 දෙසැම්බර් මස 08 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. මහින්ද සිරිවර්ධන,
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

### යෝජනාව

මෙම යෝජනාව *ගැසට් පත්‍රයෙහි* නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වූ 2021 මාර්තු 24 වැනි දිනැති අංක 2220/42 දරන ගැසට් නිවේදනයේ ඇමුණුම 11හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) සඳහා, අංක 42 වශයෙන් සඳහන් නව අයිතමය ඇතුලත් විය යුතු බවට, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

42. දේශීය සනීපාරක්ෂක තුවා නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3920.10.20 (පොලිඑතිලීන් පටල - නැප්කින් හා සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කරන්නා වූ වර්ගයකට අයත් ලෝහ නොගැන්වූ පළල මි.මී. 110ට වැඩි නමුත් මි.මී. 230ට නොවැඩි) 3920.10.90 (අනෙකුත් - පොලිඑතිලීන් පටල (ඩබ)), සහ 3926.90.99 (අනෙකුත් පොලිප්‍රොපිලීන් පටල) යටතේ වර්ගීකරණය වන අමුද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩ ආනයනය, කර්මාන්ත, විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව.

EOG 12-0276

1A G - 38396 - 41 (2022/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*